ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
University of Sri Jayewardenepura, Sri Lanka
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
External Degrees and Extension Courses Unit (EDECU)

මගේ අංකය :
My Number

නුගේගොඩ , ශ්‍රී ලංකාව
Nugegoda , Sri Lanka

ඔබේ අංකය :
Your Number

දුරකථන : 5929790, 2801481, 5929794, 2802851
Telephone

ෆැක්ස් : 2802753

2019-08 -20

## 2011- විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව (නව නිර්දේශය) ශිෂ්‍ය ලියාපදිංචිය දීර්ඝ කිරීම

නව විෂය නිර්දේශය යටතේ 2011 වර්ෂයේ විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා බඳවා ගත් බාහිර උපාධි අපේක්ෂකයන්ගේ අධ්‍යයන වර්ෂ 4ක් සහ ඊට අදාළ සියළුම පරීක්ෂණ පවත්වා අවසන් කර ඇත. පුණර් අපේක්ෂකයකු ලෙස තව දුරටත් අධ්‍යයන කටයුතු කරගෙන යාමට අවශ්‍ය නම් ඔබගේ ශිෂ්‍ය ලියාපදිංචිය දීර්ඝ කරගත යුතුය.

ලියාපදිංචිය දීර්ඝ කිරීමට අවශ්‍ය අයදුම්පත් සහ මුදල් ගෙවිය යුතු ගිණුම් අංක පහත සබැඳියට පිවිස ජාතික හැදුනුම්පත් අංකය යෙදීමෙන් බාගත (Dawnload) කර ගත හැක. එසේ ලබාගන්නා අයදුම්පත් නියමිත ගාස්තු ගෙවීමෙන් අනතුරුව ශිෂ්‍ය වාර්ථා පොතද සමඟ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, තැපැල් පෙට්ටිය අංක 10, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ ඉහළ වම් කෙළවරේ "ලියාපදිංචිය දීර්ඝ කිරීම-විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව " යනුවෙන් සඳහන් කළ යුතුය.

### ලියාපදිංචිය දීර්ඝ කිරීමේ ගාස්තු

ලියාපදිංචිය දීර්ඝ කිරීමේ ගාස්තුව එක් වසරක් සඳහා රු. 7000.00

මෙම දීර්ඝ කිරීම වසරක් සඳහා වලංගු වන අතර නව විෂය නිර්දේශය යටතේ ඉදිරියේදී පැවැත්වීමට නියමිත විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි I, II සහ III පරීක්ෂණ සඳහා අයදුම් කිරීමට අවස්ථාව හිමිවනු ඇති අතර සියළුම පරීක්ෂණ අයදුම්පත් වෙබ් අඩවියෙන් ලබාගත යුතු වේ.

උපාධිය සම්පූර්ණ කිරීම සඳහා ලබාදෙන සම්පූර්ණ කාලය වසර 7 ක් වන අතර එම කාලසීමාවෙන් පසුව ලියාපදිංචිය දීර්ඝ කරනු නොලැබේ. තවත් එක් වරක් පමණක් ලියාපදිංචිය දීර්ඝ කර ගැනීමට අවස්ථාව ඇති අතර ඒ සම්බන්ධව ඉදිරියේදී දැනුවත් කරනු ඇත.

### සැලකිය යුතුයි

ලියාපදිංචිය දීර්ඝ කිරීම සඳහා එක් අයදුම්කරුවකු වෙනුවෙන් සුවිශේෂී ගිණුම් අංකයක් බැගින් ඇති අතර අදාළ ගිණුම් අංකයටම පමණක් ගෙවීම් කළ යුතුය. අදාළ නොවන ගිණුම් අංක වලට කරනු ලබන ගෙවීම් පිළිබඳව විශ්වවිද්‍යාලය වග කියනු නොලැබේ.

**ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී**
**බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය**